සකස්කඩ

බළන්ගොඩ ආනන්දමෛත්‍රෙය ස්ථවිර



සකස්කඩ

සංඥාපනය

‘සකස්කඩ’ යනු සංස්කෘත පද බහුල මිශ්‍ර භාෂායෙන් රචිත බුද්ධ චරිතයෙකි. මෙය දොරකඩ අස්න වෙනුවට සත් දවසේ පිරිත් කිමේදී භාවිත වූවක් බව අග රතන සූත්‍රය සඳහන් කොට යොදා ඇති වාක්‍ය ඛණ්ඩයෙන් පෙනේ. එහෙත් පමා වැ බුද්ධගද්‍යය සේ ම දරුවනට අකුරු පුරුදු කරවන පාඩම් පොතක් සේ භාවිත ව ඇත. මේ දෙක අත්‍රගම රාජගුරු බණ්ඩාර පඬිතුමන්ගේ කෘති වශයෙන් සමහරු සලකති.

බළන්ගොඩ ආනන්දමෛත්‍රෙය ස්ථවිර

සකස්කඩ

නමඃ ශ්‍රී ගණාය

දීපඞ්කරාහ්වය මුනීශ්වර පාදමූලෙ

සන්ත්‍යජ්‍ය ලබ්ධමමෘතං කරුණාං විධාය

අත්‍යාහිතං පරහිතං සුකෘතං විශෙෂාත්

සිඬං නමොස්තු සුගතාය ජගඬිතාය

අප තථාගතයන් සංසිඬාශෙෂ සම්භාර විශෙෂ සාක්‍ෂාත්කරණීය සවීපාපමලප්‍රක්‍ෂාලනක්‍ෂම ආත්මමොක්‍ෂ නිරපෙක්‍ෂ වැ - උදයව්‍යය - භඞ්ග භයාදීනවාදි නවමහා විදශීනඥාන පරම්පරාධිගත නිවීාණ මහා සරසරට පරිධාවමාන සමස්ත සත්ත්‍ව මාතඞ්ගයා මහා කරුණාංකුශයෙන් හමිනා - ජාතිජරාභඞ්ග භඞ්ගීරභඞ්ග භයානක රාගද්වෙෂාවමශීමදමාන සංරම්භාදි ක්ලෙශ මකරනිකරාකීණී සංසාරමහාණීවාවතීණී ද්වාෂෂ්ටි දෘෂ්ටිජාලාවබඬ සවීසත්ත්‍වසමුඬරණානුබඬ බුඬි ඇති වැ - කායජීවිත නිරපෙක්‍ෂාභිජාත නිභීාරාභ්‍යාහිත සවීලොකෙක දීපායමාන දීපඞ්කර තථාගත ව්‍යාකරණාභිෂෙකයෙන් උදීණීක්ලෙශමලාපගම කොට නිමීල වැ - අනෙක මුක්තිමුක්තානුයාත සම්‍යක් සම්බොධි සම්භාරභාරාලඞ්කාරයෙන් සමලඬකෘත වැ - ශශ්වදූපාස්‍යමාන පාරමිතාදූතිකානුනීයමාන ධමීරාජ්‍යලක්‍ෂ්මීසඞ්ගමන මඞ්ගල්‍යයට ආරම්භ කොටැ - කල්ප කොටි ශතසහස්‍රාධික චතුරසංඛ්‍යකල්පකාලාභ්‍යාසාතිශය ස්වාත්මීකෘත සවීසම්පදාදාන නිදාන දාන ශීල නෛෂ්කාම්‍ය ප්‍රඥා වීයමී ක්‍ෂාන්ති සත්‍යාධිෂ්ඨාන මෛත්‍ර්‍යුපෙක්‍ෂාලක්‍ෂණ දශවිධ පාරමිතා සාගරයෙහි පාරප්‍රාප්ත වැ - මාරාරාතිචක්‍රාක්‍රමණසන්නඬ බුඬාංකුර මහා යොධාඬ්‍යුෂිත තුෂිත භවනාරූඪ වැ - ශ්‍රඬානුරාගාවජීජිතාමිතාමරවරවධූ විධූයමාන මකරචාරුචාමරධවලීකෘතොදාර පාණ්ඩරතර කීර්ති විමානයෙහි වැඩැ වෙසෙමින් භක්තිප්‍රෙමාතිභාරාවනත්‍ර සවීසුරාසුරවර චක්‍රචාරුචූඩාමණිමරීචිසඤ්චය පරිචුම්බිත චරණනඛමයූඛ ජාලාභිෂෙකයෙන් භුවනත්‍රයයට අභිෂෙක දී - දුගීති දුගීාභිමුඛ වැ පරිධාවමාන සමස්ත සත්ත්‍ව සන්‍දශීනයෙන් සමුද්විග්න වැ - දිව්‍යබ්‍රහ්මයන් විසින් සමාරාධිත වැ - මහාසම්මත පරම්පරානුයාත ශුඬ සූයවීවංශාභිජාත සවීගුණ ගණාභරණ විභූෂිත කීර්තිමාලා පරිශුඬ ශුඬොදන මහාරාජොපනිඃශ්‍රයයෙන් අපරිමිත පුණ්‍යසම්භාර රූපලාවණ්‍ය ගුණොපෙත මහාමායා දේවීන් ගභීචෛත්‍යාන්තගීභීයෙහි ආත්මීය ප්‍රතිසන්‍ධාන ධාතුනිධාන කොටැ - ස්ඵටික චෛත්‍යාන්තගීතවිරාජමාන කනක ප්‍රතිමානුකාරයෙන් දිලිසෙමින් දශ මාසයක් මාතෘ ගභීයෙහි වැසැ - වසන්ත මදමොදමානමුඛර මධුරතර

භාරභරිතාංකුරිත කුසුමිත ඵලිතපල්ලවලතා විතාන විතත විචිත්‍ර විශාලසාල සලල කෙශර නක්තමාල තමාල නීප කදම්බාදී තරුෂණ්ඩ මණ්චිත ලුම්බිනී වනොද්‍යානයෙහි මාතෘගර්භයෙන් ප්‍රසූත වැ මහාබ්‍රහ්මොපනීත ස්වර්ණජාලයෙන් ලොකපාල දිව්‍යපුත්‍රොපනීත අජිනචර්මයෙන් මනුෂ්‍යොපනීත දුකූල චුම්බටකයෙන් ක්‍රමයෙන් වැඩැ - වසුධාඞ්ගනා මස්තකෙකශෙඛර භාවයට පම්ප්‍රාප්ත වැ - අශෙෂ දොෂාන්ධකාර නිකර නිරාකරණ සමුද්ගත තරුණ තරණී මණ්ඩලානුකාරයෙන් දිලිසෙමින් දශදිශා විලෝකනය කොටැ - අනන්තාපරිමාණ ලොකධාතු පර්යාපන්න සමස්තසත්ත්ව නිකායයෙහි ආත්මසදෘශාධික පුද්ගලාන්තරයක්හු නැති සේ දැකැ - උත්තරදිශාභිමුඛ වැ සප්තපදව්‍යතිහාරාවසානයෙහි වැඩැ සිටැ - "අග්ගොහමස්මි ලොකස්ස, ජෙට්ඨොහමස්මි ලොකස්ස, සෙට්ඨොහමස්මි ලොකස්ස අයමන්තිමාජාති නත්ථිදානි පුනබ්භවො" යි අභීත සිංහනාද කොටැ - සර්ව සුරාසුරවර මත්තමාතඞ්ගමානමදපරිශොෂණ නිපුණ සිංහනාද පරිපූරිතාශෙෂ භවනකුහර ඇති වැ ශාක්‍යාධිරාජසිංහ පොතකොත්තමයෙන් චතුරචතුරාශීතිසහස්‍රකුලප්‍රභෙදවිස්තීර්ණ බන්ධු වර්ගයා මධ්‍යයෙහි විරාජමාන වැ ශුක්ලපක්ෂාභිවර්ධමාන චන්ද්‍රමණ්ඩලානුකාරයෙන් ක්‍රමාභිවෘද්ධ වැ ප්‍රභාස්වරතරවරාඞ්ගනා මද්‍යයෙහි විරාජමාන චන්ද්‍රලෙඛානුකාරී යශොධරා ප්‍රමුඛානෙක කොටි නාටක ස්ත්‍රීන් පරිවෘත වැ - ප්‍රතිදිනාරබ්ධමංගල කපිලවාස්තු මහානගරවරයෙහි ක්‍රීඩානුභවයෙන් ඒකොනත්‍රිංශත් සංවත්සරාතික්‍රාන්ත කොටැ ජරාජීර්ණ රොගාවතීර්ණ මරණාවතීර්ණ පූර්වනිමිත්ත සත්ත්වසන්දර්ශනයෙන් සමුද්විග්න වැ ප්‍රව්‍රජිත රූපසන්දර්ශනයෙන් නිවෘත්ත වැ, නෛෂ්ක්‍රාම්‍යාභිමුඛ මනසින් සන්තුෂ්ට වැ, ඡන්න නම් අමාත්‍ය ද්විතීය වැ - අනෙක කොටි සතසහශ්‍ර චක්‍රවාලාන්තරාල පරිස්ඵුරිත දිව්‍ය බ්‍රහ්ම ගණාකීර්ණ පාරිජාත මන්දාර මකරන්ද බින්දු සින්ධුරිතාංගසුන්දරතර චතුරතර තුරංගයානයෙන් ප්‍රයාණය කොට, අනොමා තීරයට සම්ප්‍රාප්ත වැ - සර්වාභරණ විභූෂිත කනකවර්ණ දෙහශොභා ඇති බැවින් සුපුෂ්පිත කර්ණිකාර තරුශිඛර සමුර්ඩ්වාගත භ්‍රමරාවලී ලීලායෙන් ආත්මීය ඛඞ්ගධාරා සමුච්ඡින්න කෙශධාතු ආකාශයෙහි විහිදැ ඝටීකාර මහාබ්‍රහ්මොපනීත විශිෂ්ටාෂ්ටපරිෂ්කාරයෙන් ප්‍රව්‍රජිත වැ ප්‍රව්‍රජ්‍යාසුඛස්මෘති රසාස්වාදයෙන් සප්තාහාතික්‍රාන්ත කොටැ රාජගෘහ නගරවරයෙහි භික්ෂාටනයෙන් සන්තර්පිත වැ ෂට්-සංවත්සර මාත්‍රයක් ප්‍රධාන භූමියොග කොටැ - කෂ්ටව්‍රත සමාදානයෙන් මොක්ෂයාගේ අලභ්‍යභාවය ලොකයාහට ප්‍රකාශ කොට සුජාතොපනීත ක්ෂීරපායාස ප්‍රතිග්‍රහණයෙන් රූපකායානුග්‍රහය කොටැ ස්වස්තිද්විජොපනීත කුශමුෂ්ටිග්‍රහණයෙන් මාරාතිසංග්‍රාම භූමිස්ථානීය බොධි මණ්ඩපයට සම්ප්‍රාප්ත වැ - පෘථිවි සමුද්භෙදොද්ගත කුසුම පර්යංකවරචාර සමාරූඪ වැ චතුරංග සමන්විත වීර්යාධිෂ්ඨානයෙන් පර්යංක බන්ධනය කොටැ - තත්කාල සමායාත සංග්‍රාමාතිභීෂණ මත්ත මාතඞ්ග තුරඞ්ගාඩම්බර හර්ෂිහෙෂාරව බධිරීකෘතාශෙෂ ත්‍රිභුවන භවන පුටපාටනපටු පටහ පණව දුන්දුභිධ්වනි ප්‍රලයාසනි සම්පාත නිර්ඝොෂයෙන් ඝොෂ වූ දොර්දණ්ඩමණ්ඩලොෂිත නිශිත කොදණ්ඩ දණ්ඩ

කාණ්ඩ කම්පන භින්දිවාල කරවාලාධිචන්ද්‍රචක්‍රාදි විවිධායුධ සහස්‍ර දුර්වාර සපරිවාර මාරපරාජය කොටැ - ප්‍රථම යාම සමධිගත පූර්වේනිවාසානුස්මෘති ඥානාලොක බලයෙන් අතීත කාලවර්තී සර්ව දොෂාන්ධකාර නිකර නිරාකරණය කොටැ - මධ්‍යමයාම සමධිගත දිව්‍යචක්ෂුරභිඥානාලොක බලයෙන් චවමානොපපද්‍යාමානාද්‍යනෙක සත්ත්ව සමීක්ෂණයෙන් නාගතාමිත කාලවර්ත්‍යඥානතමොජාලප්‍රදාලනය කොටැ - පශ්චිමයාම සමධිගතසවාසනාසර්වක්ලෙශසමුච්ඡෙද සමස්තාෂ්ටාංගායර්‍යමාර්ගඥාන ලක්ෂණ ආස්‍රවක්ෂයකරාභිඥානාලොක බලයෙන් වර්තමාන ඝනතරාඥානතිමිර පටල පුටපාටනය කොට මෙසේ වූ ත්‍රිවිද්‍යාඥානාලොක බලයෙන් අධිවත්‍රිතය සර්ව දොෂාන්ධකාර දූරීකරණයෙන් සංස්කාර විකාර ලක්ෂණ නිර්වාණ ප්‍රඥප්ති යන පඤ්චවිධඥෙයමණ්ඩලයෙහි ඓශ්වර්‍යය කෙරෙමින් අනාවරණ ඥානාභිෂෙකයෙන් සර්වධර්මාධිරාජ්‍යපදයෙහි සුප්‍රතිෂ්ඨිත වැ - ස්ථානභවයොනිගතිවිඥානස්ථිති සත්ත්වාවාස භෙද භින්න සර්වසත්ත්වවර්ගාශ්‍රිත ක්ලෙශාරිවර්ගසමුච්ඡෙද චතුර චතුරාශීති සහස්‍ර ධර්මස්කන්ධ මහා නගරවරයට සම්ප්‍රාප්ත වැ චතුවෛශාරද්‍ය දශබල චතුර්දශ බුද්ධඥානාෂ්ටාදශ බුද්ධ ධර්ම ද්වාත්‍රිංශද්වර මහාපුරුෂලක්ෂණයෙන් හා අශීත්‍යනුබ්‍යඤ්ජනව්‍යාමප්‍රභාකෙතුමාලාලඞ්කාරයෙන් විරාජමාන වැ - තථාගතවර ධර්මචක්‍රවර්ත්ති තමා නානා දෙශයෙහි නානා කාලයෙහි නානාවිධ විනෙය සත්ත්වාශයානුශය චරිතාධිමුක්ති වශයෙන් සද්ධර්මාමෘත වර්ෂා කෙරෙමින් සර්වසම්පන්න ශ්‍රාවස්ති මහා නගරවරොපනිඃශ්‍රය කොටැ - සර්වධර්මාධිරාජධානි ස්ථානීය ජේතවන මහා විහාරයෙහි වැඩ වෙසෙමින්, දෙසුවා වූ සුවාසූ දහසක් ධර්මස්කන්ධයට අන්තර්ගත වූ විශාලා මහනුවර ජනපද රොගභය පලවා - කෙළලක්ෂයක් සක්වළෙහි ආඥා පැතිරැ දිලිසෙමින් සිටි රුවන් සූත්‍රයෙහි වදාළ තාක් ආඥා ගුණ තොජොබල මෛත්‍රී පුණ්‍ය ප්‍රභායෙන් සියල් ලෝවැස්සනට ද මට ද සේනුසේ විය යුතු.

සර්වාන්තරායවර මහබිනික්මන් සකස්කඩ නිමි.

සිද්ධිරස්තු